# ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය
# සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය

# පුරප්පාඩු

**පහත සඳහන් තනතුර සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

## අධ්‍යක්ෂ (HM 1-1) - තනතුරු 01

**බාහිර අයදුම්කරුවන් - සුදුසුකම්**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ක්‍රීඩා කළමනාකරණ / ව්‍යාපාර පරිපාලන / රාජ්‍ය පරිපාලනය / රාජ්‍ය කළමනාකරණය / මානව සම්පත් කළමනාකරණය / වානිජ්‍ය හෝ තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ වෙනත් උපාධියක් ලබා තිබීම. **සමඟ**

තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයකින් පශ්චාත් උපාධියක් (Masters) ලබා තිබීම හෝ තනතුරට අදාළ ක්ෂේත්‍රයට ගැලපෙන්නාවූ පිළිගත් වරලත් වෘත්තිය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වයක් ලබා තිබීම **සහ**

රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක "කළමනාකාර මට්ටමේ" අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර පහළොවක (15) ක පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් - සුදුසුකම්**

කළමනාකාර සේවා (MM 1-3) සේවා ගණයන්හි I වන ශ්‍රේණියෙහි තනතුරක අවම වශයෙන් වසර පහ (05) ක අදාළ විෂය ක්ෂේත්‍රයේ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම සමග බහුවිධ කාර්යයන්හි නියුතු කණ්ඩායම් සඳහා නායකත්වය සැපයීමේලා මෙන්ම මානව හා අනෙකුත් සම්පත් කාර්යක්ෂමව කළමනාකරණයෙහිලා නිශ්චිත ප්‍රවීනතාවය.

**වැටුප් පරිමාණය හා කාණ්ඩය : HM 1-1 – රු : ( 80,295– 15 X 2,270–114,345)**

**වයස් සීමාව** : අවුරුදු 35 ට නොඅඩු විය යුතු අතර, 55 ට නොවැඩි විය යුතුය.

## ක්‍රීඩා නිලධාරී (MA 1-1) - තනතුරු 04

**බාහිර අයදුම්කරුවන්**

**(01) අධ්‍යාපන සුදුසුකම්**

(අ) අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී

i. සිංහල / දෙමළ

ii. ගණිතය

iii. ඉංග්‍රීසි භාෂාව (තත් කාර්ය භාරය අනුව අවශ්‍ය වන්නේ නම් පමණක්)

යන විෂයයන් ඇතුළුව විෂයයන් හතරකට (04) සම්මාන සහිතව එක්වර විෂයයන් හයකින් (06) කින් සමත්වී තිබීම.

(ආ) අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයයන් තුනක් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

**(02) අතිරේක සුදුසුකම් (තාක්ෂණික නිපුණතා / ප්‍රවීණතා)**

(අ) ජාතික ක්‍රීඩා විද්‍යායතනයේ ක්‍රීඩා ඩිප්ලෝමාව ලබා තිබීම සහ අවම වශයෙන් අවු 03 සේවා පළපුරුද්ද හෝ ජාතික වෘත්තිය කුසලතා (NVQ) පහ (05) මට්ටමට අඩු නොවන්නාවූ ක්‍රීඩා කළමනාකරණ පිළිබඳ ඩිප්ලෝමා සහතිකයක් ලබා තිබීම හෝ ත්‍රිවිධ හමුදාවල උසස් ශාරීරික අභ්‍යාස උපදේශක පාඨමාලාව සමත්වීම / විදේශ ශාරීරික අභ්‍යාස උපදේශක පාඨමාලාවක් සමත්වී තිබීම සහ අවම වශයෙන් අවු 03 සේවා පළපුරුද්ද තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්** :

(අ) ප්‍රාථමික ශ්‍රේණිය – ශිල්පීය නොවන, අර්ධ ශිල්පීය සහ ශිල්පීය සේවා ගණයන්හි පහත "ආ" "ඇ" සහ "ඉ" සඳහන් සුදුසුකම් ඇති සේවකයින්ට මේ සඳහා අයදුම් කළහැකිය.

(ආ) අපොස (සා පෙ) විභාගය එක්වරකදී පළමු භාෂාව / ගණිතය යන විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයයන් 06කට නොඅඩුව සමත්වී තිබිය යුතුය.

(ඇ) සේවයෙහි ස්ථිර පත්වීම් දැරිය යුතු අතර, එම පත්වීම් වල ස්ථිර කරනු ලැබ සිටිය යුතුය.

(ඉ) නියමිත දිනට පූර්වාසන්නව ස්ථිර පත්වීමක යටත් පිරිසෙයින් අවුරුදු 05 ක අඛණ්ඩ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතුය.

**වැටුප් පරිමාණය හා කාණ්ඩය : MA1-1 රු:(27,910–10X300–7X350–4X495–20X660 – 48,540)**

**වයස් සීමාව :** අවුරුදු 18ට නොඅඩු විය යුතු අතර, 45ට නොවැඩි විය යුතුය.

## කළමනාකරණ සහකාර (MA 1-1) - තනතුරු 06

**බාහිර අයදුම්කරුවන්**

- **අධ්‍යාපන**

(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා / පෙළ) විභාගයේදී

i. සිංහල / දෙමළ

ii. ගණිතය

iii. ඉංග්‍රීසි භාෂාව (තත් කාර්ය අනුව අවශ්‍ය වන්නේ නම් පමණක්) යන විෂයයන් ඇතුළුව විෂයයන් හතරකට (04) සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) සමත්ව තිබීම

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ / පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයයන් තුනක් (03) (සාමාන්‍ය පොදු පරීක්ෂණ හැර) සමත්ව තිබීම.

(ඇ) තනතුරට විශේෂිත අවශ්‍ය වෙනත් සුදුසුකම් (පරිගණක වදන් සැකසුම / යතුරුලියනය පිළිබඳ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා පාඨමාලාවක් හදාරා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

(අ) ප්‍රාථමික / ශිල්පීය නොවන, අර්ධ ශිල්පීය සහ ශිල්පීය සේවාගණයන්හි පහත "ආ" "ඇ" සහ "ඉ" සඳහන් සුදුසුකම් ඇති සේවකයින්ට මේ සඳහා අයදුම්කළ හැකිය.

(ආ) අපොස (සා / පෙළ) විභාගය එකවරකදී පළමු භාෂාව / ගණිතය යන විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයයන් 06කට නොඅඩුව සමත්වී තිබිය යුතුය. (පරිගණක වදන් සැකසුම / යතුරු ලියනය පිළබඳ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා පාඨමාලාවක් හදාරා තිබීම හෝ වෙනත් ඒ හා සමාන මට්ටමේ නිපුණතාවයන් අදාළ අවස්ථාවන්හිදී සුදුසුකම් වශයෙන් ඇතුළත් කරනු ලැබිය හැක.)

(ඇ) සේවයෙහි ස්ථිර පත්වීම් දැරිය යුතු අතර, එම පත්වීම් වල ස්ථිර කරනු ලැබ සිටිය යුතුය.

(ඉ) නියමිත දිනට පූර්වාසන්නව ස්ථිර පත්වීමක යටත් පිරිසෙයින් අවුරුදු 05 ක අඛණ්ඩ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතුය.

**වැටුප් පරිමාණය හා කාණ්ඩය : MA1-1රු:(27,910 –10X300 –7X350 –4X495 –20X660–48,540)**

**වයස් සීමාව :** අවුරුදු 18ට නොඅඩු විය යුතු අතර, 45ට නොවැඩි විය යුතුය.

## රියදුරු (PL 3) - තනතුරු 02

**බාහිර අයදුම්කරුවන්**

**අධ්‍යාපන සුදුසුකම්**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙක (02) ක් සහිතව විෂයයන් හය (06) කින් සමත් වීම.

**ප්‍රවීණතා**

මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ බර වාහන පැදවීම සඳහා වූ මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලබා තිබීම සහ රියදුරු ලෙස බලපත්‍රය ලැබීමෙන් පසු රිය පැදවීම සම්බන්ධයෙන් අවම වශයෙන් වසර තුන (03) ක පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ බර වාහන පැදවීම සඳහා වූ මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලබා තිබීම සහ රියදුරු බලපත්‍රය ලබාගැනීමෙන් පසු රිය පැදවීම සම්බන්ධයෙන් අවම වශයෙන් වසර තුන (03)ක පළපුරුද්දක් ලබා තිබීම. **සහ**

ප්‍රාථමික අර්ධ ශිල්පීය (PL2) හෝ ප්‍රාථමික ශිල්පීය නොවන (PL1) සේවා ගණයක වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම. අයදුම්පත් කැඳවන අවසාන දිනයට පූර්වාසන්න වසර 05 තුළ විනයානුකූලව දඬුවම් ලබා නොතිබීම. පූර්වාසන්න වසර 05 තුළ කාර්ය සාධනය උසස් මට්ටමක් පැවතීම.

**වැටුප් පරිමාණය හා කාණ්ඩය : PL3 රු : (26,290–10X270–10X300–10X330–12X350–39,490)**

**වයස් සීමාව :** අවුරුදු 18ට නොඅඩු විය යුතු අතර, 45ට නොවැඩි විය යුතුය.

## ක්‍රීඩාංගණ සහයක (PL1) - තනතුරු 05

**බාහිර අයදුම්කරුවන්**

**අධ්‍යාපන සුදුසුකම්**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් විෂයයන් දෙකක් (02) සමත්වීම.

**වැටුප් පරිමාණය හා කාණ්ඩය : PL1 රු : (24,750–10X250–10X270–7X300–15X330–37,000)**

**වයස් සීමාව :** අවුරුදු 18ට නොඅඩු විය යුතු අතර, 45ට නොවැඩි විය යුතුය.

**පොදු කොන්දේසි :**

- ශ්‍රී ලංකාවේ පුරවැසියන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ.
- අයදුම්පත් 2024-07-12 දිනට හෝ ඊට පෙර සහතිකවල සහතික කරන ලද පිටපත්ද සහිතව පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කළයුතුය.
- අභ්‍යන්තර අයදුම්කරුවන් හා දැනට රාජ්‍ය සේවයේ නියුක්තවූවන් ආයතන ප්‍රධානීගේ නිර්දේශය සහිතව අයදුම්පත්‍රය ඉදිරිපත් කිරීමට කටයුතු කරන්න.

**සැ. යු :** ඉහත තනතුර සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන් තෝරාගනු ලබන්නේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමත බඳවා ගැනීම් පටිපාටියේ විධි විධානවලට අනුකූලවයි.

**සභාපති,**
**සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය,**
**තැ පෙ 2211, ආතර් ද සිල්වා මාවත, කොළඹ 13.**